"මේ විදියට හැසිරී කොවිඩ් මරණ අතරට යනවා ද? වගකීම ඔබේ අතේ..." යනුවෙන් වූ සිරස්තලයක් සමගින් දිනමිණ පුවත්පතේ (08/19) පළවී තිබූ ඡායාරූප පෙළක, පුද්ගලයින් කොවිඩ්-19 සෞඛ්‍ය නිර්දේශ පිළිනොපදින ආකාරය දක්වා තිබුණි. එම ඡායාරූපයන්හි සිටිනා පුද්ගලයන්ගේ අනන්‍යතාවය කිසිදු ආකාරයකින් ආරක්ෂා කර නොතිබුණි.

එසේම, "කොවිඩ් එක්ක ජීවිතේ" යන සිරස්තලයෙන් යුතුව ඊළඟ දින දිනමිණ පුවත්පතේද (08/20) කලින් දින ඡායාරූපයන්ම කිහිපයක් ඇතුළු ඡායාරූප පෙළක් දැක්වී තිබිණි. නමුත්, එම ඡායාරූප වල පුද්ගලයන්ගේ අනන්‍යතාවය පැහැදිලිව හඳුනාගත නොහෙන පරිදි දැස් බොඳ කර දක්වා තිබිණි.

කොවිඩ්-19 වසංගතය මර්දනය සඳහා සෑම අයෙකුම සෞඛ්‍ය නිර්දේශයන් පිළිපැදීම අත්‍යාවශ්‍ය වන අතර, ඒ සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම සහ සෞඛ්‍ය නිර්දේශයන් පිළිපැදිය යුතු බවට නැවත නැවත සිහිපත් කිරීම මාධ්‍ය වගකීමක් බව සැබෑය. නමුත්, එම වගකීම ඉටු කිරීමේදී පුද්ගලයෙකුට සිය පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය උල්ලංඝනය කිරීම සහ පුද්ගල ගරුත්වය ආරක්ෂා නොකිරීම යහපත් කරුණක් නොවේ.

මේ එකම පුවත්පතක දින දෙකක පළවී ඇති එකම ඡායාරූප විශේෂාංග දෙකකි. එසේම දිනමිණ සහෝදර පුවත්පත් වන තිනකරන් (08/18) සහ ඩේලි නිව්ස් (08/18) පුවත්පත් වලද මෙම ඡායාරූප එහි සිටින්නන්ගේ අනන්‍යතාවයන් ආරක්ෂා කිරීමකින් තොරව පළ කර තිබිණි. කෙසේ නමුත් දෙවැනි දිනමිණ ඡායාරූප විශේෂාංගය (08/20) බලන විට, පුද්ගල අනන්‍යතාවය හෙළිදරවු නොකොට, පුද්ගල ගරුත්වය ආරක්ෂා කරමින් වුවත් සෞඛ්‍ය නිර්දේශයන් පිළිපැදීමේ වැදගත්කම පිළිබඳ පණිවුඩය සමාජයට ලබාදීමට හැකි බව පෙනී යයි.

එසේ නම්, පළමු දිනමිණ ඡායාරූප විශේෂාංගයේ සිටිනා පුද්ගලයන්ගේ අනන්‍යතාවය හෙළි වන්නට හැර ඇත්තේ මන්ද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #sinhalanews #Dinamina**